# ගුවන් ප්‍රහාර, ඉන්දියාව හා බ්‍රිතානිය

කොටි ත්‍රස්තවාදී ම්ලේච්ඡයන්ගේ ගුවන් ප්‍රහාර ගැන අසන්නට ඇති ප්‍රශ්න කිහිපයක් වෙයි. මෙහි දී යොදා ගැනෙන්නේ සැහැල්ලු ගුවන් යානා යැයි කියැවෙයි. එහෙත් ඒ ගුවන් යානාවලට පහරදීමට ගුවන් හමුදාවට තවමත් නොහැකි වී ඇත. එසේ වුවත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් යානාවලට කොටි ඇතැම් විට පහර දෙති. සැහැල්ලු ගුවන් යානයක් බිම දැමීමට තවමත් අපට නොහැකි වුයේ ඇයි? මේ යානා ඇත්තටම සැහැල්ලු යානා ද? ඒ යානාවල ගමන්කරන්නේ කොටි ත්‍රස්තවාදීන් නම් ඔවුන් බෝම්බ හෙළීමට පුරුදු වුයේ මෙරට ද නැත්නම් පිටරටක ද? ඔවුන් මෙරට පුහුණුව ලැබී නම් ඒ පිළිබඳව මෙතෙක් තොරතුරක් ලබාගෙන නැත්තේ ඇයි? ඔවුන් එසේ පුහුණුවනු දුටු අය ඇත් ද? කොටි ත්‍රස්තවාදීන් පිටරටක පුහුණුව ලැබී නම් ඒ කිනම් රටක දී ද?

මේ අතර කටුනායක රේඩාර් පද්ධතිය ගැන විවිධ තොරතුරු පැතිරෙයි. ලංකාව විසින් චීනයෙන් රේඩාර් පද්ධතියක් ලබාගැනීමට සූදානම් වූ විට ඉන්දියාව එයට විරුද්ධත්වය පළකර ඇත. ඒ ඉන්දියාවේ ආරක්ෂාව පෙරදැරි කරගෙන යැයි පැවසෙයි. රේඩාර් පද්ධතිය ඉන්දියාවෙන් ලබාගත යුතු යැයි ඉන්දියාව ප්‍රකාශකර ඇත. ඒ අනුව පද්ධතිය ඉන්දියාවෙන් මිල දී ගෙන ඇත. එහෙත් එසේ ලබාගත් පද්ධතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රශ්න ඇතැයි කියැවෙයි. මේ පිළිබඳ නියම තත්වය කුමක් වුවත්, අප රේඩාර් පද්ධතියක් මිල දී ගැනීමේ දී එයට ඇඟිලිගැසීමට ඉන්දියාවට ඇති අයිතිය කුමක් ද? ඉන්දියාවෙන් හෝ භාරතයෙන් හෝ අපට එතරම් යහපතක් සිදු වී නැත. අපට යම් යහපතක් සිදුවුයේ නම් ඒ දඹදිවින් ය. දඹදිව, භාරතය හා ඉන්දියාව යනු එකම ප්‍රදේශයක් නො වේ. එහි ඇතැම්විට භූගෝලිය වශයෙන් සමපාතී ප්‍රදේශ ඇතිමුත් සංස්කෘතික හා දේශපාලනික වශයෙන් ගත්කල ඒ විවිධ වෙයි. භාරතය වෛදිකයන්ගේ ද, ඉන්දියාව ඉංගිරිසින්ගේ ද නිර්මාණ වෙයි. බුදුන් වහන්සේ වැඩසිටියේ දඹදිව මිස භාරතයේ හෝ ඉන්දියාවේ හෝ නො වෙයි. අශෝක රජු දඹදිව රජෙක් විය. එහෙත් හස්තිනාපුරය භාරතයේ ද, නවදිල්ලිය ඉන්දියාවේ ද පිහිටියේ ය.

අද මෙරට තත්වය වඩමාරච්චි දිනවල තත්වයට තරමක් සමාන ය. වඩමාරච්චි මෙහෙයුමෙන් කොටින්ට පහර වදිනවිට ඉන්දියාව ගුවනින් පරිප්පු හෙළා ලංකාව බිය වැද්දී ය. එනම් එවකට සිටි ජයවර්ධන ජනාධිපති බියවැද්දීමට ඩික්සිත් සමත් විය. අද ද ශ්‍රී ලංකා හමුදාවේ සීමිත මෙහෙයුම් යටතේ කොටි දිගින් දිගට ම පරාජය වෙති. ඉන්දියාව මෙන් ම බටහිර රටවල් ද අද කොටි සංවිධානයට විරුද්ධ ය. එහෙත් ඒ එක රටක්වත් කොටි පරාජයවනු දැකීමට අකමැති ය. එයට හේතුව කොටි පරාජය වුවහොත් දෙමළ ජාතිවාදයේ අවශ්‍යතාව පරිදි බලය බෙදා සිංහලත්වය පරාජය කර සන්ධීය රාජ්‍යයක් ඇතිකිරීමට නොහැකි වේ යැයි ඔවුන් සිතන බැවින් ය. එබැවින් ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට සන්ධීය විසඳුමක් ලබාගන්නා තෙක් ඉන්දියාව මෙන් ම බටහිර රටවල් ද කිනම් කතා කීව ද, කොටි ආරක්ෂාකිරීම තම ප්‍රතිපත්තිය කරගෙන ඇත.

ශ්‍රී ල නි ප පසුගිය දා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් තම යෝජනා ඉදිරිපත් කෙළේ ය. ජනවාර්ගික ප්‍රශ්නයක් නැති රටක දිස්ත්‍රික්ක මට්ටමින් හෝ ව්‍යවස්ථාදායක බලය බෙදිය යුතු නො වෙයි. දැනටමත් ඒ යෝජනා දෙමළ පක්ෂ, මුස්ලිම් පක්ෂ හා එ ජා ප විසින් ප්‍රතික්ෂේප කෙරී ඇත. සමසමාජ කොමියුනිස්ට් වැනි කසිකබල් මාක්ස්වාදී පක්ෂ ද ඒ යෝජනාවලට එකඟ නොවනු ඇත. ඒ සියල්ලට ම වඩා බටහිර රටවල් හා ඉන්දියාව ඒ යෝජනා නොපිළිගනු ඇත.

අද මේ ආණ්ඩුව කිනම් ක්‍රමයකින් හෝ වට්ටවා රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවා බටහිරයන්ට හා ඉන්දියාවට අවශ්‍ය අන්දමට බලය බෙදීමේ අවශ්‍යතාව ඇතැමකුට හා ඇතැම් රටවලට පැන නැඟී ඇත. රනිල් වික්‍රමසිංහ මහතා මසකින් දෙකකින් ආණ්ඩු පිහිටුවීමට කතාකරන අතර වැඩිපුර පිටරට සිටින්නේ නිකමට නො වෙයි. ඔහුට බටහිර මුළුමනින් ම සහයෝගය දෙයි. එ ජා ප මන්ත්‍රීන් සිරභාරයට ගැනීමේ කතා, ඊනියා මානව අයිතිවාසිකම් ආරක්ෂාකිරීමට වික්‍රමසිංහ මහතා කරන කතා, ඇම්නස්ටි බෝල කතා, ආදිය එකම දම්වැලක පුරුක් වෙයි. අද පරිප්පු දේශපාලනයටත් වඩා භයානක තත්වයක් උදා වී ඇත. කොටින්ගේ ගුවන් ප්‍රහාර ගැන අපට කල්පනාකිරීමට සිදුවන්නේ එවැනි පසුබිමක ය.

© Prof. Nalin De Silva

මේ සැහැල්ලු යැයි කියන ගුවන් යානා ඉන්දීය රේඩාරවලට හසුනොවන්නේ නම් ඉන්දියාව අකමැති වුවත් අපට ඒ උපකරණ චීනයෙන් හෝ වෙනත් රටකින් හෝ මිල දී ගැනීමට සිදුවෙයි. මේ ගුවන්යානවල ගමන්කරන්නේ කොටි පමණක් ම විය හැකි ය. එසේත් නැතහොත් සුපිරි බලවතකුගේ ආධාර ලබන කොටි නොවන පිරිසක් විය හැකි ය. එසේත් නැතහොත් සුපිරි බලවතකුගේ ආධාර ලබමින් කොටි ඒ ගුවන්යානාවල ගමන්කරනවා විය හැකි ය. මේ ප්‍රහාර කොටින්ගේ පමණක් ම නම් ඉන් ඉන්දියාවට තර්ජනයක් නොවන්නේ ද? එහෙත් ඉන්දියාව රටක් ලෙස ගත්කල මේ ලිපිය ලියන මොහොත වන තෙක් ම ඒ ප්‍රහාර හෙළා දැකවත් නැත.

පසුගිය දා බ්‍රිතාන්‍ය මහා කොමසාරිස්වරයා ඩේලි මිරර් පුවත්පතේ කතුවරිය මුණගැසී තමා (ආණ්ඩුවට විරුද්ධව) පුවත්පත පැත්තේ යැයි කීම ද භයානක කරුණකි. අප රටේ ස්වෛරීභාවය ඉතා දිළිඳු මට්ටමක පවතියි. කසිකබල් බටහිර දේශපාලන විද්‍යාඥයකු කිසිම රටකට ස්වෛරීභාවයක් නැතැයි යන අන්දමේ ගොන් ප්‍රකාශ කිරීමට ඉඩ ඇත. එහෙත් බ්‍රිතාන්‍යයේ සිටින ලංකා මහා කොමසාරිස්වරිය එසේ එරට ආණ්ඩුවට විරුද්ධව පුවත්පතක පැත්ත ගතහොත් එරට ස්වෛරීභාවය ක්‍රියාත්මක වන ආකාරය ගොනකුට වුවත් දැනගැනීමට හැකිවනු ඇත. බ්‍රිතාන්‍ය මහා කොමසාරිස්වරයා පත්තරයට ගිය දාම ඔහු නිගරු පුද්ගලයකු කර බ්‍රිතාන්‍යයට පිටත්කර හැරිය යුතු ව තිබුණි. මහා කොමසාරිස්වරයා ඉතා පැහැදිලිව ම බ්‍රිතාන්‍යයේ සුපුරුදු ආකාරයට ලංකාණ්ඩුවට එරෙහිව මානව අයිතිවාසිකම්, භාෂණ ප්‍රකාශනය ආදිය පිළිබඳ ගොනුවක් සකස්කරමින් සිටියි.

ඒ අතර පසුගිය දා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ලංකාවේ දෙමළ ජනයා පිළිබඳ සර්ව පාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමක් පත්කෙළේ ය. ලංකාවේ දෙමළ ජනයාට ගෞරවනීය හා යුක්තිගරුක සාමයක් ඇතිකිරීමට කටයුතුකිරීම එහි මූලික කාර්යභාරය වෙයි. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මෙවැනි සර්ව පාක්ෂික කණ්ඩායමක් පත්කළ පළමු වතාව මේ යැයි කියනු ලැබෙයි. මේ පාර්ලිමේන්තු කණ්ඩායම ලංකාණ්ඩුව, කොටි ත්‍රස්තවාදීන් හා නෝර්වේ අතර ඉක්මනින් ම සාකච්ඡාවක් ඇතිකිරීමට බලාපොරොත්තු වෙයි. එමෙන් ම ඒ සාකච්ඡාවට සහභාගිවන්නන්ට පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් මුණගැස්වීම ද, ලංකාවේ සංචාරයක යෙදීමද පාර්ලිමේන්තු කණ්ඩායමේ අරමුණු වෙයි.

මේ තවදුරටත් මෙරට ස්වෛරීභාවයට ඇඟිලිගැසීමකි. බ්‍රිතාන්‍යයේ යම් කටයුත්තක් ගැන සොයාබැලීමට පාර්ලිමේන්තු කණ්ඩායමක් පත්කිරීමට ලංකාවේ පාර්ලිමේන්තුවට හැකිකමක් වේ ද? බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සිතන්නේ කෝල්බෲක් කොමිසම මෙන් ලංකාව සම්බන්ධයෙන් ඔවුන්ට කොමිසම් පත්කළ හැකි බව ද? මේ කණ්ඩායමට ලංකාණ්ඩුවේ දැඩි විරෝධය පළකළ යුතු අතර ඔවුන්ට ලංකාවට පැමිණීම තහනම් කර ඔවුන්ගේ කිසිම සාකච්ඡාවකට ලංකාණ්ඩුව සහභාගි නොවිය යුතු ය. මෙරට දෙමළ ප්‍රශ්නය ඇතිකිරීමට මගපෑදුවෝ ලන්දේසීහු ය. ප්‍රශ්නය ඇතිකළෝ බ්‍රිතාන්‍යයෝ ය. අපේ ලිපිවලින් මේ පිළිබඳ කියා ඇති බැවින් වැඩිදුරටත් ඒ ගැන සඳහන්කිරීම අනවශ්‍ය වෙයි.

එහෙත් බ්‍රිතාන්‍යයන්ගේ මේ ද්‍රෝහී ක්‍රියා පිළිබඳ තවමත් බොහෝ දෙනා ඒ අයුරින් නොසිතති. ඒ අපේ අධ්‍යාපනයේ ප්‍රශ්නයකි. බ්‍රිතාන්‍යය ප්‍රශ්නයේ මැවුම්කරුවා මිදිවාට විසඳුම් දෙන්නා බවට ද පත්වී ඇත. මෙතෙක් කල් නෝර්වේ ක්‍රියා කෙළේ බ්‍රිතාන්‍යය වෙනුවෙන් ය. දැන් බ්‍රිතාන්‍යය එළිපිටම සිංහලත්වයට විරුද්ධව පෙනී සිටියි. හොඳ හොඳ නැටුම් එළිවෙන ජාමෙට කීවාක් මෙන් නොබෝ කලකින් තව තවත් බ්‍රිතාන්‍ය සෙල්ලම දැකගත හැකිවනු ඇත.

පරිප්පු දේශපාලනයෙහි යෙදෙන ඉන්දියාවත්, කොමිසම් දේශපාලනයෙහි යෙදෙන බ්‍රිතාන්‍යයත් හඳුනා නොගෙන තවදුරටත් කටයුතු කළහැකි නො වෙයි. අපේ අධ්‍යාපනයෙන් අපට උරුම වී ඇති ඔලගු කරෙන් ඉවත්කර ප්‍රශ්නයේ ඉතිහාසය කලාපයේ ඉතිහාසය ආදිය බ්‍රිතාන්‍ය ඇසින් බැලීම දැන්වත් නැවැත්විය යුතු ය. බ්‍රිතාන්‍යය හා ඉන්දියාව මෙන් නොව මිතුරු රටවල් ලෝකයේ ඇත. අප ඒ රටවලට කිවයුත්තේ ලංකාවේ දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්න ඔවුන්ට සිදු වී ඇතැයි කියන අසාධාරණ ආදිය අන් කිසිවක් නොව දෙමළ ප්‍රභූන්ට බ්‍රිතාන්‍යයන් දුන් වරප්‍රසාද සර්වජන ඡන්දයත් සමග ක්‍රමයෙන් අහිමිවීමක් පමණක් බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva